අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය - උතුරු පර්ෂදය
අංක 31, නුවර පාර
දළුගම
කැළණිය

බිඑෆ්/එන්පිඑෆ්/01 (172)

සියළු ස්ථාන (නාවික/ගුවන් හැර)

2016 සැප්තැම්බර් 08

<u>අනුගාමික දිමනා උප ගිණුම වෙතින් මුදල් වැයදැරීම සඳහා උපදෙස් ලබාදීම</u>

යොමුව :

අ. බිඑෆ්/එන්පිඑෆ්/එෆ්ඒ/02/2010 (29) හා 2010.08.13 දිනැති අයවැය හා මුපඅම ලිපිය.

1. තුලවාසි නිලධාරීන් වෙනුවෙන් අනුගාමික දිමනා වශයෙන් නිලධාරි නිවස්න ගිණුමට බැරවන මුදල් අනුගාමිකයන්ට සිදුකරනු ලබන ගෙවීම් සඳහා භාවිතා කරනු ලැබේ. අදාල අනුගාමික දිමනා ගෙවීමෙන් අනතුරුව අනුගාමික දිමනා උපගිණුමේ සංචිත වශයෙන් ඉතිරිව ඇති මුදල් පොදු ගිණුම වෙත මාරුකර නිලධාරි නිවස්නයේ පොදු අවශ්‍යතා සඳහා දේපල (උදා :- රූපවාහිනි යන්ත්‍ර, රෙදි සෝදන යන්ත්‍ර, බිලියඩ් මේස සහ පිඟන් භාණ්ඩ ආදිය) මිලදිගත හැකි අතර ඒ සඳහා පහත සඳහන් ක්‍රියාපිලිවෙත අනුගමනය කළයුතුවේ.

අ. අනුගාමික දිමනා ගිණුමේ ඉතිරිව ඇති මුදල හිමි අයවළුන් පැහැදිලිව හඳුනාගත හැකිනම් එම අයවළුන්ගේ ලිඛිත කැමැත්ත ලබාගැනිම.

ආ. අනුගාමික දිමනා ගිණුමේ ඉතිරිව ඇති මුදල හිමි අයවළුන් පැහැදිලිව හඳුනාගත නොහැකිනම් වාර්ෂික මහසභා රැස්වීම මගින් අතිරික්තව පවතින මුදල පොදු ගිණුමට මාරුකර දේපල මිලදිගැනිම සඳහා යෝජනාවක් සම්මත කරවාගෙන එය සාකච්ජා සටහනට ඇතුලත් කිරිම.

ඇ. ලිඛිත කැමැත්ත/සාකච්ජා සටහන බලයට ගෙන අදාල මුදල පොදු ගිණුමට මාරුකිරිම.

ඈ. භාණ්ඩ මිලදිගැනිමේදි ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකුගේ සභාපතිත්වයෙන් යුතුව මණ්ඩලයක් පත්කර යුද්ධ හමුදා පිලිවෙත අනුව මණ්ඩලය අනුමත කරවාගෙන භාණ්ඩ මිලදිගැනිම.

ඉ. භාණ්ඩ මිලදිගන්නා අවස්ථාවේදිම මුදල් ගෙවන බැවින් උපරිම වට්ටම් (DISCOUNT) සහිතව භාණ්ඩ මිලදිගැනිමට උපදෙස් ලබාදිම.

ඊ. හමුදා නියෝග ඒ - 13 හා යොමුව 'අ' දරණ ලිපිය මගින් දේපල වර්ගිකරණය කිරිම පිළිබඳව ලබාදි ඇති උපදෙස් අනුගමනය කිරිම.

උ. මිලදිගන්නා ලද 'ඒ' දේපල ක්ෂයකිරිම සඳහා අධිකාරිලත් නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් පත්කර යොමුව 'අ' දරණ ලිපියේ උපදෙස් ප්‍රකාරව ආයුකාලය නිර්ණය කිරිම, නිවැරදිව ක්ෂයකිරිම හා ගිණුම්ගත කිරිම.

2. අනුමත අවශ්‍යතා සඳහා මුදල් වියදම් කිරීමේදී යුද්ධ හමුදා මූලස්ථානය වෙතින් සිදුකරන ඉදිරි විගණන කටයුතු හා පාලන පරීක්‍ෂණයන්හිදී ඉදිරිපත්කිරීමට හැකිවන පරිදි ඊට අදාල ඇස්තමේන්තු, මිලගණන්පත්, බිල්පත්වල මුල් පිටපත් සහ අදාල සියලුම ලියකියවිලි සහිත ලිපිගොණු නිලධාරි නිවස්න කමිටු සභාපතිගේ අධීක්‍ෂණය යටතේ සුරක්‍ෂිතව තබත්තු කිරීමට පියවර ගතයුතු බව කාරුණිකව දන්වා සිටිනු ලැබේ.

ඩබ්ලිව් පී එල් පද්මකුමාර
බ්‍රිගේඩියර්
අධ්‍යක්‍ෂ අයවැය හා මුදල් පරිපාලන